# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 101 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 20/01/2024 පැය 1150

## මාධ්‍ය නිවේදනය

**ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව - කොළඹ දකුණ කොට්ඨාසය.**

කොළඹ දකුණ කොට්ඨාසයේ ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව 2024.01.19 වන දින මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ගරු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී හා ජාතික ආරක්ෂාව පිළිබඳ උපදේශක සාගල රත්නායක, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම් විශ්‍රාමික ගුණතිලක, වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් කොළඹ නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විණි.

මෙම වැඩමුළුවේදී මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමා විසින් පැමිණ සිටි පිරිස අමතා **තමා අමාත්‍ය ධූරයේ සිටින තුරු "යුක්තිය" මෙහෙයුම අඛණ්ඩව සිදු කරන බවටත්, කිසිදු බලපෑමකට යටත් නොවන බවටත් ප්‍රකාශ කර ඇත.** ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් විසින් ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාට, අමාත්‍යාංශයේ ගරු ලේකම් විශ්‍රාමික ගුණතිලක මහතාට සහ වැඩබලන පොලිස්පතිතුමාට සමරු ඵලක පිළිගැන්වීමක් සිදු කරන ලදී. මෙම වැඩමුළුවට සමගාමීව විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් හට රෝද පුටු ප්‍රදානය කිරීමක් සිදුකරන ලද අතර, මහජනතාවගේ ගැටළු සහ යෝජනා ලිඛිතව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

මෙම අවස්ථාවට පොලිස් විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර, ප්‍රජා පොලිස් හා සංචාරක දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහේෂ් සේනාරත්න, කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍රකුමාර හා ප්‍රජා පොලිස් කොට්ඨාසයේ අධ්‍යක්ෂ ඩී.කේ. ප්‍රියන්ත යන මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගී විය.